# අපට ඇත්තේ නම් ආදේශ කරමින් කියවීමය

උවිඳු කුරුකුලසූරිය
05.03.2007

ජනාධිපති හින්ඩන්බර්ග් ට හිට්ලර් ගැන හොඳ තක්සේරුවක් තිබුණත් 1933 ජනවාරියේදී ඔහුටත් සිදුවූයේ හිට්ලර් චාන්සලර්වරයා ලෙස නම් කරන්නටය. ඒකාධිපතිත්වය ආරම්භවූයේ එතැන් පටන්ය. ස්වකීය හෙන්චයියන් වැදගත් තනතුරුවල රැඳවූ හිට්ලර් ස්වකීය දේශපාලන ප්‍රතිවාදීන් කුමනාකාරී උපක්‍රමයකින් හෝ මරා දැමීමෙන් ජයගන්නට පසුබට නොවීය.

1933 ජනවාරි 30 වැනි දා චන්සලර්වරයා ලෙස පත්වූ හිට්ලර් 1933 පෙබරවාරියේ එක් රාත්‍රියකදී ගෝරින් හා ගොබෙල්ස් සමඟ රහසේ කුමන්ත්‍රණය කර රයිෂ්ටැග් නම් ජර්මානු පාර්ලිමේන්තුවට ගිනි තැබුවේය. පුවත්වත් වහාම මේ සහසික ක්‍රියාව කොමියුනිස්ට් වාදීන් පිට පැවරුවෝය. 'මේ අපරාධකරුවන්ට' දඬුවම් දීම සඳහා ආඥාවක් පණවන ලද්දේය. එතැන් පටන් පුද්ගලික නිදහස, අදහස් පලකිරීමේ නිදහස, පුවත්පත් නිදහස ඈ සියලු අයිතිවාසිකම් නාසීන් අතින් කප්පාදු විය. තමන්ට අභිමත ඕනෑම අයෙකු අත්අඩංගුවට ගැනීමේ, අලුතෙන් හඳුනාදෙන ලද වැරැදි වලට වරද කරුවන් කරවා දිගට හරහට මිනී මැරීමේ සියලු ඉඩකඩ ඔවුන් අතට පත්විය. විචාරයකින් තොර දේශප්‍රේමයක් හා ජාත්‍යාලයක් එහි අඩංගු විය. 1933 මාර්තු 23 වැනි දායින් පසුව ජර්මනිය තුළ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වීම නැවතුණි. ඒ එසේ වූයේ කිසියම් බලහත්කාරයක් ක්‍රියාවට නැංවීම තුළින් නොවේ. පරිපූර්ණ නීතිමය ක්‍රියාදාමයක් ක්‍රියාවට නැංවීම තුළිනි. ඒනියා 'හැකියා ලබා දීමේ පනත' (ඇබ්ඉකසබට 'ජඑ) මඟින් නීති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියට සහභාගී වීම පාර්ලිමේන්තුව අත හැර දැමුවේය. වගන්ති පහකින් සමන්විත මේ පනතින් අයවැය පාලනය කිරීමේ බලය උදුරා ගැනුණු අතර අයවැය පාලනය සහ විදේශ රටවල් සමඟ ගිවිසුම් අත්සන් කිරීම වැනි කටයුතුවලින් ද පාර්ලිමේන්තු ඈත් කොට තැබිණි. එපමණක් නොව මේ පනතින් හිට්ලර්ට නීති කෙටුම්පත් කිරීමේ බලය ද පවරා දුණි. එම පනත යටතේ ව්‍යවස්ථාවෙන් බැහැරව නීති සම්පාදනය කිරීමේ බලය හිට්ලර්ට පවරා පාර්ලිමේන්තුව සියදිවි නසා ගත්තේ ය.

ඒ නයින් මුළු මහත් ජර්මනියම නාසි පාලනයට බලහත්කාරයෙන් නතු කරගැනීමේ 'නීත්‍යානුකූල' බලය හිට්ලර්ට හිමි විය. මේ සියලු දෑ සඳහා අන්අය පිට දොස් පවරන්නට ජර්මානුවන්ට බැරිය. ඔවුන් දොස් පවරා ගත යුත්තේ තමන්ටමය. ව්‍යවස්ථා අයථා ලෙස තම ප්‍රයෝජනය පිණිස යොදවා තම මනාපය පරිදි ආණ්ඩුවක් පිහිටවා ගැනීම සඳහා අවශ්‍ය බලය හිට්ලර්ට ලබා දුන්නේ රයිෂ්ටැගය ගිනි තැබීමෙන් පසු නිකුත් කළ ආඥාවන් සහ හැකියාවන් ලබාදීමේ පනතය. ඒවාගේම ව්‍යවස්ථාව මෙසේ අයථා ලෙස පරිහරණය කිරීම සමඟ භීෂණය සහ ප්‍රචණ්ඩක්‍රියාද අත්වැල් බැඳගති. දේශපාලන සතුරන්ට හා යුදෙව්වන්ට හිංසා පීඩා පමුණුවා ගුටි බැට දී හිරේ විලංගුවේ දමා අන්තිමේදී මරා දමනු ලද්දේය. 1943 වන විට පළමුවන වද කඳවුර පිහිටුවා එය එස් එස් හෙවත් ෂුට්ස්ටාෆල්ස් (ආරක්ෂක ක්‍රියාන්විතයෝ) නමින් හැඳින්වෙන හිට්ලර්ගේ පුද්ගලික ආරක්ෂක බල මුළුවේ භාරයට පත්කෙරිණි. මේ සුවිශේෂ බලමුළුවේ නායකයා වූයේ හයින්රිච් ය. ඔහු මේ සංවිධානය ගොඩනැගුවේය. ගෙස්ටාපෝ නම් අප කීර්තිමත් රහස් පොලිසිය එම රාජ්‍යයේ අත්‍යවශ්‍ය  අංගයක් බවට පත්කරන ලද්දේය. අන්තිමේදී සකල විධ ජනඝාතන හා පිටුවහල් කිරීම්වලට මුල්වූයේ මේ ආයතනයයි.

හිට්ලර්ගේ මඟ අවුරා සිටි අන්තිම පුද්ගලයා වූයේ හින්ඩර්න්බර්ග් ය. ඔහු 34 අගෝස්තු දෙවනදා මිය ගියේය. දැන් හිට්ලර්ගේ අධිකාරයට අභියෝග කරන කිසිවෙකු නැත.

ඉන්නේ ඔහුගේ පොරොන්දුවලින් දෑස් අන්ධවූ අය පමණය. ඔහුගේ ඒකාධිපතිත්වය සම්පූර්ණ වූ අතර ඔහු ලෝකය මෙතෙක් දුන නොසිටි නිර්දය බලගතු පාලකයා වශයෙන් ජනතාව පාලනය කරන්නට පටන් ගති.

ඒ ජර්මනියේ ගිය සිය වසේ මුල් කාර්තුවේ සිදුවූ දෙයේ සංක්ෂිප්තයකි. ලංකාවේ අපට ඇත්තේ නම් ආදේශ කිරීම පමණි. ඔබට කැමති නම් ආදේශ කරමින් අවශ්‍ය වෙනස්කම් කරමින් ඉහත කතාව නැවත කියවා බලන්න. යමක් නොකෙරුවොත් වරද භාර ගන්නට සිදුවෙයි.